09 සැප්තැම්බර් 2022

# මාධ්‍ය වාර්තාව

1979 දී මාස 6ක් සඳහා තාවකාලික විධිවිධාන පනතක් ලෙස පනවනු ලැබූ සහ වසර 40කට වැඩි කාලයක් අඛණ්ඩව ක්‍රියාත්මකව පවතින කුරිරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත :ඡඹ– අහෝසි කිරීම සඳහා අපි දීප ව්‍යාප්ත අත්සන් තැබීමේ ව්‍යාපාරයක් දියත් කර ඇත්තෙමුග එදා ආණ්ඩුවට විරුද්ධව තිබුණු අසහනකාරී තත්වය යටපත් කිරීම සඳහා මෙම නීතිය පාවිච්චි කළ බව අපි දුටුවෙමුග

එය අතීතයේ සිදුවූවාක් මෙන්ම අදත් අඛණ්ඩවම සිදුවෙමින් පවතීග විශේෂයෙන්ම ගාලුමුවදොර අවිහිංසාවාදී අරගලකරුවන්ව අත්අඩංගුවට ගැනීම සඳහා පාවිච්චි කරනු ලැබුවේද මෙම නීතියමයිග

හෙට දින (10.09.2022) පෙරවරු 9.00 ට මාවිට්ටපුරම්, කන්දසාමි කෝවිලේ සිට ආරම්භ වන මෙම **කන්කසන්තුරේ සිට හම්බන්තොට** දක්වා පැවැත්වෙන **දීප ව්‍යාප්ත ජංගම විරෝධතාවය** ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන බවට රජය දුන් පොරොන්දුව ඉටුකිරීමටයි

කරුණාකර මෙම සමාරම්භක උත්සවයට සහභාගී වන ලෙස ඔබ සැමට කාරුණිකව ආරාධනා කර සිටිමු, අප හා එක් වී මෙම ත්‍රස්ත මර්ධන පනත අහෝසි කිරීමේ පෙත්සමට අත්සන් තබන මෙන් ඉල්ලා සිටිමුග

| | | |
|---|---|---|
| කි. සේයෝන් | ම. ආ. සුමන්තිරන් | ජෝසෆ් ස්ටාලින් |
| ඉලංගෛ තමිලරසු කිට්චි – තරුණ පෙරමුණ | සර්ව ජන යුක්ති | වෘත්තීය සමිති හා බහුජන සංවිධාන එකතුව |